# වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව

# වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව

## 2025 වර්ෂයේ/ 05 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්ථාව

## 2025.09.09

සහභාගි වූ මන්ත්‍රීවරුන්

1. ගරු  සභාපති ටී.බී.ඩී ඇන්ටනී කුමාර් මයා
2. ගරු උප සභාපති  එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා
3. ගරු මන්ත්‍රි ඩබ්.ඇලේක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා
4. ගරු මන්ත්‍රි එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා
5. ගරු මන්ත්‍රි කේ.වී.සුසන්ත පෙරේරා මයා
6. ගරු මන්ත්‍රි බී.ඒ.එස්. සාන්ත පෙරේරා මයා
7. ගරු මන්ත්‍රි ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා
8. ගරු මන්ත්‍රි ඩබ්.ඒ.ආර්.ෂවීන් ප්‍රනාන්දු මයා
9. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය
10. ගරු මන්ත්‍රි ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා
11. ගරු මන්ත්‍රි කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා
12. ගරු මන්ත්‍රි කේ.බී.වරුණ පෙරේරා මයා
13. ගරු මන්ත්‍රි ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා
14. ගරු මන්ත්‍රි ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා
15. ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය
16. ගරු මන්ත්‍රි සී.ජුඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා
17. ගරු මන්ත්‍රි අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා
18. ගරු මන්ත්‍රි ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා
19. ගරු මන්ත්‍රි ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයා
20. ගරු මන්ත්‍රි කේ.එල්.සමන් රෝහිත මයා
21. ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය
22. ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය
23. ගරු මන්ත්‍රි එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා
24. ගරු මන්ත්‍රි ජගත් කීර්ති කුමාර අබේරත්න මයා
25. ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය
26. ගරු මන්ත්‍රි ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා
27. ගරු මන්ත්‍රි කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා
28. ගරු මන්ත්‍රි ඒ.ඒ.චොහාන් සන්දීප් මයා
29. ගරු මන්ත්‍රි කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා
30. ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය

31. ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මයා
32. ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා
33. ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා
34. ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා
35. ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා
36. ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා
37. ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය
38. ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය
39. ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රන්තිලක මිය
40. ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා
41. ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා
42. ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා
43. ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මයා

<u>සහභාගි නොවූ මන්ත්‍රීවරුන්</u>

1. ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය

මෙදින පෙ.ව 9.00ට මහ සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති ටී.බී.ඩී. ඇන්ටනී කුමාර් මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශිය සභා මහ සභා රැස්වීම් ශාලාවේදි ආරම්භ විය.

1. **2025.08.12 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.**

2025.08.12 දිනැති මහ සභා වාර්තාව සත්‍යයක් බව ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව පහත සඳහන් සංශෝධන වලට යටත්ව ගරු මන්ත්‍රී කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කිරීමෙන් පසු සභා සම්මත විය.

**2025.08.12 දින පැවති මහ සභා රැස්වීම් වාර්ථාවේ සංශෝධන :-**

**<u>යෝජනා අංක 31</u>**

සීමාසහිත සමගි සමූහ ව්‍යාපාරය විසින් වෙන්නප්පුව බස් නැවතුම්පොළ අසල දැන්වීම් පුවරුවක් සවි කිරීමට අදාලව කර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා වූ යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද සිදු වූ අතර එය ඒකමතිකව සම්මත වූවා සේ සැලකිය නොහැකි බව ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා පැවසූ අතර එය සංශෝධනය විය යුතු බව පවසන ලදි.

**<u>යෝජනා අංක 28</u>**

කෘෂි කාර්මික කටයුතු සඳහා ප්‍රාදේශිය සභාව සතු එක්ස්කැවේටර් යන්ත්‍ර සුදුසු අවස්ථාවල නිදහස් කර දෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර තිබූ යෝජනාවට අදාලව ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා එම යෝජනාවට පක්ෂව කරුණු ඉදිරිපත් කල අතර එම යන්ත්‍රෝපකරණ කෘෂි කාර්මික කටයුතු සඳහා යෙදවීම සුදුසු බවත් එම සියලුම ක්‍රියාවලින් කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව සිදු කිරීම සුදුසු බව පැවසූවත් එය වාර්තාවේ සඳහන් නොවූ බැවින් එය සංශෝධනය විය යුතු බව පවසන ලදි.

**<u>වෙනත් කරුණු 7(iv)</u>**

2028 වර්ෂය වන විට ආර්ථිකය වෙනස් විය හැකි ආකාරය පිළිබඳව නියාමනයන් ඉදිරිපත් කල අතර එය 5.3% ලෙස වාර්තාවේ සඳහන් වී තිබූ අතර එය 5%ක් ලෙස නිවැරදි විය යුතු බව ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් පවසන ලදි.

2. **ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන**

1. පළාත් පාලන සභිකවරියන්ගේ සංසදය පුත්තලම දිස්ත්‍රික් නිලවරණය 2025 සැප්තැම්බර් මස 12 වන දින කාක්කපල්ලිය නිලාවින් හෝටලයේදි පෙ.ව 9.30ට පැවැත්වේ. ඒ සඳහා සියලුම සභිකවරියන් වෙත ආරාධනා කර ඇත.

2. වර්තමාන මන්ත්‍රී මණ්ඩලය සභාවේ වැඩ ආරම්භ කර මාස 03ක කාලයක් ගත වී ඇත. සභාවේ අයවැය ප්‍රතිපාදන තුල ඉටුකල හැකිව තිබූ වැඩ කොටස් වලින් 75%ක් නිම කර ඇත. ඉතිරි වැඩ කටයුතු නිම කිරීමට පියවර ගෙන ඇත. වයඹ පළාත් සභාවෙන් ලැබුනු මුදල් ප්‍රතිපාදන මත වැඩ විෂයන 09 ක් නිම කර ඇත. ඊට අමතරව වැඩ විෂයන් 06 ක කටයුතු ක්‍රියාත්මක වෙමින් පවති.

3. පළාත් පාලන අමාත්‍යාංශයේ මුදල් ව්‍යාපෘති 02ක් සඳහා අනුමත වී ඇත. අනුමත මුදල රු.25,000,000.00 කි. මල අපද්‍රව්‍ය පිරිපහදු ව්‍යාපෘතිය සඳහාද අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබා දීමට අමාත්‍යාංශය එකඟතාවය පල කර ඇත. ඊට අදාල ඇස්තමේන්තු සකස් කරමින් පවති.

4. සභාවේ මහජන සේවාවන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වෙනස් කිරීම් කිහිපයක් ගතවූ මාස 03ක කාලය තුල ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව එම කටයුතු වල

ප්‍රගතියක් දක්නට ඇත. ඒ සඳහා සහයෝගය ලබා දුන් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීමණ්ඩලය වෙත හා කාර්යමණ්ඩලය වෙත ස්තුතිය පුද කර සිටිමි.

5. දැන්වීමකින් තොරව කාරක සභා රැස්වීම් වලට ගරු මන්ත්‍රීවරුන් නොපැමිණෙන අවස්ථා නිරීක්ෂණය වී ඇත. එම නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස දන්වා සිටිමි.

6. අභිනව පළාත් පාලන මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් සඳහා පවත්වනු ලබන විධායක සහතික පත්‍ර පාඨමාලාව පිළිබඳ තොරතුරු දැනටමත් ඔබ වෙත ලබා දී ඇත. සැප්තැම්බර් 20 වන සෙනසුරාදා සිට සෑම සෙනසුරාදා දිනකම මාර්ගගත ක්‍රමයට දේශන පැවැත්වේ. පාඨමාලා කාලය මාස 06කි. නොමිලේ පැවැත්වෙන මෙම පාඨමාලාව සඳහා සැප්තැම්බර් 10 දිනට ප්‍රථම ලියාපදිංචි විය යුතු බව දන්වා සිටිමි.

## 3. යථා පරිදි කල් දී ඇති යෝජනා

1) 2024 වර්ෂයේ 4වන පරිපූරක ඇස්තමේන්තුව අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි.

| ආදායම් උපයා ගන්නා අය විෂය | | | | ප්‍රතිපාදන වෙන් කරන වැය විෂය | | | |
|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන | අය විෂය | අය විෂය විස්තරය | ආදායම් ඇස්තමේන්තුව<br>රු. ශත | වැඩසටහන | වැය විෂය | වැය විෂය විස්තරය | වියදම් ඇස්තමේන්තුව<br>රු. ශත |
| සුභ සාධක සේවා | 281-06-00-00-81-ii (මධ්‍ය රජය ප්‍රාග්ධන ආධාර) | රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ආධාර (පළාත් පාලන බල ප්‍රදේශ වල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන | 9,930,820.58 | සුභ සාධක සේවා | 281-06-05-00-09-01- | වෙල්ලමංකරය වෙරළ උද්‍යානය සනීපාරක්ෂක ව්‍යාපෘතිය ඉදි කිරීම | 9,930,820.58 |
| භෞතික සැළසුම් | | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ( පළාත් පාලන මාර්ග) | 1,000,000.00 | භෞතික සැළසුම් | 281-03-00-00-04-07 | මංමාවත්/පදික වේදිකා පාලම් කාණු අළුත්වැඩියාව (බණ්ඩිරිප්පුව පතිමා වත්ත පාර අළුත්වැඩියා කිරීම) | 1,000,000.00 |
| එකතුව | | | **10,930,820.58** | | | | **10,930,820.58** |

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා පවසා සිටියේ රාජ්‍ය පරිපාලන පළාත් සභා පළාත් අමාත්‍යාංශයේ ආධාර මුදලක් ලෙස වෙල්ලමංකරය වෙරළ උද්‍යානයට කෝටියකට ආසන්න මුදලක් ලැබෙන අතර නව රජය බලයට පත් වූ දා පටන් රුපියල් මිලියන 347,500ක මුදලක් ණයට ගෙන ඇති අතර ඇතැම් අවස්ථාවල 10%ක පොලියට වසරකට ලබා ගෙන ඇති නමුත් එම මුදල් උපයාගත යුතු වන අතර 2025.05.20 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේදි මේ පිළිබඳව අදහස් ඉදිරිපත් කල අතර මෙම ව්‍යාපෘතිය සඳහා කොන්දේසි පවත්වාගෙන කටයුතු කරන ලෙස ඉල්ලා සිටි අතර අද වන විට නාරා ආයතනයෙන් වාර්තා ලබාගෙන එම ස්ථානය සුදුසු ස්ථානයක්ද යන්න සොයා බලා ප්‍රගතියක් දක්වන ආකාරයෙන් සිදු කිරීම සුදුසු බව පවසන ලදි. නාස්තිය, දූෂණය පිටුදැකීමට ආ ගමනේදි මුදල් නාස්තියක් සිදු වීමට ඉඩ ඇත්නම් මෙම ක්‍රියාවලියට විරුද්ධ

වන අතර ඒ සඳහා සියලු දෙනාගේම ඡන්ද විමසීමක් අවශ්‍ය බව පවසන ලදි. ඒ අනුව මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීමට ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය විසින් ස්ථිර කරන ලදි. ඒ අනුව ඉහත යෝජනාවට පක්ෂව ගරු සභාපති ටී.බී.ඩී.ඇන්ටනි කුමාර් මහතා, ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා, ගරු මන්ත්‍රී කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා, ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා, ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය, ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා , ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා, ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා, ගරු මන්ත්‍රී ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයා, ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මයා, ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය, ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය, ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා, ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය, ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා, ගරු මන්ත්‍රී කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සන්දීප් මයා, ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා, ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය, ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා සහ ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා ඡන්දය ප්‍රකාශ කල අතර යෝජනාවට විරුද්ධව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී බී.ඒ.එස්. සාන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා, ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ආර්.ෂවීන් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය, ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා, ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා, ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය, ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය, ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රත්තිලක මිය, ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා, ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා සහ ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මයා ඡන්දය ප්‍රකාශ කරන ලදි. ඒ අනුව ඉහත යෝජනාවට පක්ෂව ඡන්ද 25ක් ලැබුණු අතර විපක්ෂව ඡන්ද 18ක් ලැබුණි. ඒ අනුව වැඩි ඡන්ද 7කින් යෝජනාව සම්මත විය.

ඉන්පසු නැවත කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීමට ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි.

2) වෙන්නප්පුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ වරිපනම් සීමාවෙන් පිටත කසල ඉවත් කිරීමේ සේවාව සපයන නිවාස සඳහා මසකට රු.200.00 බැගින් අය කිරීම හා එම ගාස්තු අය කිරීමේ කටයුතු සිදු කරන සෞඛ්‍ය සේවකයින් වෙත අය කරන මුදලින් 50%ක් ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.සුරංග රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා විසින් ස්ථිර කරන ලදි.

ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය කතා කරමින්, ඉහත යෝජනාවට එතුමිය විරුද්ධ වන බව ප්‍රකාශ කරන ලදි. එයට හේතුව නම් මීට වසර 05කට පෙර ගරු සභාපති ලෙස කටයුතු කල ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ මැදිහත්වීම මත කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව ජනපද සඳහා වරිපනම් ගෙවීම නිදහස් කල බව පවසන ලදි. එම ජනපද තුල ජීවත් වන ජනතාවගේ ජීවන රටාව ඉතා දුෂ්කර වන අතර රු.200ක මුදලක් ගෙවීමට ඔවුන්ට අපහසු බව පවසන ලදි. එම නිසා මෙම රු.200ක මුදල ජනපද ආශ්‍රිත ජනතාවගෙන් අය කර

නොගන්නා ලෙස ඉල්ලා සිටින ලදි. මෙලෙස ඔවුන්ගෙන් එම මුදල අය කිරීමට කටයුතු කිරීමෙන් ඔවුන්ට පවතින මුදල් අපහසුතා මධ්‍යයේ එම මුදල නොගෙවා මාර්ගයන් අසල කසල ගොඩගසා පිලිස්සීමට පුරුදු වීමට හැකි බැවින් එය තවත් ගැටලුවක් වීමට හැකි බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එම්.සුරංග රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මහතා කතා කරමින්, ජනපද වල වෙසෙන ජනතාවට එම මුදල් ගෙවීමට යම් ගැටලුවක් පවතී නම් එම මුදල ගෙවීමෙන් ඔවුන්ව නිදහස් කිරීමට හැකියාවක් පවතින බව පවසන ලදි. මෙම ක්‍රියාවලිය යම් විනිවිදභාවයකින් කිරීමට බලාපොරොත්තු වන අතර මහ ජනතාව අගතියට පත් නොවන ආකාරයෙන් කටයුතු කිරීමට ක්‍රියාවලියක් සකසා ඇති බවද පවසන ලදි. එමෙන්ම කිරිමැටියාන කොම්පෝස්ට් අංගනයේ ඉතිහාසය පුරාවටම නිෂ්පාදනය වී ඇති කොම්පෝස්ට් ප්‍රමාණය එහි සිටින සේවකයින්ගේ වියදම් සහ විදුලි බිල් පවා ආවරණය කල නොහැකි තත්වයක තිබුනද වර්තමානය වන විට සාමාන්‍ය අගය තිබූ ටොන් 18ක ධාරිතාව ඉක්මවා යමින් ඉතා හොඳ ප්‍රගතියක් අත්කරගෙන ඇති අතර ඉදිරියේදී එය තවත් පුළුල් කිරීමට කටයුතු සූදානම් කරමින් පවතින බව පවසන ලදි.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා කතා කරමින්, ගරු මන්ත්‍රී එම්.සුරංග රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කල අදහසට එකඟ නොවන බව පවසන ලදි. එයට හේතුව නම් එතුමාගේ පාලන කාලයේදීත් කසල එකතු කිරීම නිසි ලෙස සිදු කල බවත් එය ප්‍රාදේශීය සභාවක මූලික අංගයක් වන බවත් පවසන ලදි. එමෙන්ම එකල කිරිමැටියාන ප්‍රදේශයේ පැවතියේ ආදර්ශමත් කොම්පෝස්ට් අංගනයක් වූ අතර 2022 වර්ෂයේ සියලු දෙනා මැදිහත් වී සාකච්ඡා කරමින් හා අරගල කරමින් කොම්පෝස්ට් අංගනය වැඩි දියුණු කිරීමට පළාත් පාලන අමාත්‍යාංශයේ මුදල් ලබා ගනිමින් කටයුතු කල අතර ඉන්පසු එය ලාභ ලබන ආයතනයක් බවට පරිවර්තනය වූ බවත් පවසන ලදි. ඒ අනුව රු.200 ක මුදලක් ජනතාවගෙන් අය කිරීම සම්බන්ධයෙන් එතුමා විරුද්ධ බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා කතා කරමින්, පවුල් 3000කින් රු.200 බැගින් අය කරමින් ලක්ෂ 72ට ආසන්න මුදලක් අයකර ගත හැකි බවත් එයින් 50%ක් සභාවටත් අනෙක් 50% කසල එකතු කරන සේවකයිනටත් ලබා දිය හැකි බව 2025.08.20 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාවේ සඳහන් තිබූ අතර සේවකයින්ට ප්‍රාදේශීය සභාවෙන් වැටුපක් ගෙවන බැවින් ඔවුන්ට එම අමතර 50% අවශ්‍ය නොවන අතර එම 50% ද සභාවට ලබා ගැනීම සුදුසු බව යෝජනා කරන ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, මුදල් එකතු කිරීමට ට්‍රැක්ටර් රථවල කටයුතු කරන සේවකයින් බලය පැවරිය නොහැකි අතර එසේ සිදු කරන්නේ නම් විදුලි කාර්මිකයින්ට සහ ක්ෂේත්‍ර නිලධාරින්ටද එම 50% හිමි විය යුතු බව පවසන ලදි. එහෙත් එම මුදල් එකතු කිරීම පිළිබඳව කිසිවෙකුට නිර්දේශ කල නොහැකි අතර එම කොමසාරිස්තුමාගේ අනුමැතියට භාජනය කලහොත් එම සේවකයින්ට වසර අවසානයේ ලැබෙන බෝනස් මුදලද නැති වීමට ඉඩ ඇති අතර එය සේවකයින්ට සිදු කරන අසාධාරණයක් බව පවසන ලදි. ඒ අනුව ඉහත යෝජනාවට තමාද එකඟ නොවන අතර එය කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව සිදු වන්නේ නම් ගැටලුවක් නොපවතින බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මහතා කතා කරමින්, මීට පෙර පැවති ආණ්ඩු සමයේ ප්‍රාදේශීය සභාව මඟින් කසල රැස් කිරීමේදී රු.300ක මුදලක් අය කල බව ලවසන ලදි. වර්තමානය වන විට ව්‍යාපාරයක් ලෙස නවාතැන් පහසුකම් සහිත බෝඩිම් කාමර තනා ඇති අතර එම නිවෙස් වල පදිංචි ජනතාවට ගම පිළිබඳ හැඟීමක් නොමැති හෙයින් මාර්ග දෙපස කසල ගොඩ ගැසීමට පුරුදු වී සිටී.

එම තත්වයන් නිරීක්ෂණය නොකිරීමද ප්‍රාදේශිය සභා නිලධාරින්ගේ දුර්වලතාවයක් බවද පවසන ලදි. ඒ අනුව එතුමාගේ යෝජනාව වූයේ රු.200 නොව කලින් පැවති මුදල් අය කිරීම සුදුසු බවයි. එයිදි එම මුදල ගෙවීමට අපහසු අයට යම් සහනයක් ලබා දී ම කටයුත්ත සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි. ඒ අනුව එම අදාල මුදල් අය කරන්නේ නම් ජනතාවට අවශ්‍ය පහසුකම් සලසා දිය යුතු බවද පවසන ලදි.

ඒ අනුව මේ පිළිබඳ පැහැදිලි කිරීමට ලේකම් තුමාට අවස්ථාව ලබා දීම සඳහා මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන් පසු ලේකම්තුමා විසින් කසල රැස් කිරීමේ ගාස්තුව පිළිබඳ පැහැදිලි කරන ලදි. ඉන් පසු නැවත කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීමට ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි.

ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා කතා කරමින්, කසල රැස් කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති යෝජනාව හොඳ වන අතර ලේකම්තුමා පැවසූ ආකාරයට ව්‍යවස්ථාව අනුව ප්‍රාදේශිය සභා වලට නීති පනවා ගැනීමට බලතල ඇති බව පවසන ලදි. එහෙත් එම නීති ප්‍රදේශයට උචිත ආකාරයෙන් පනවා ගත යුතු බව පවසන ලදි. එහෙත් එතුමා දකින ආකාරයට කාලයක් පටන් පැවති ක්‍රියාවලින් තුල මෙවැනි අර්බුදයක් හට නොගත් අතර ආණ්ඩුව 40%ක් කපා හැරීමට ගත් වැරදි තීරණ නිසා මෙවැනි තත්වයකට මුහුණ දීමට සිදු වී ඇති බවත් පවසන ලදි. වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව වයඹ පළාතේ ඉහලම තත්වයක පැවතුනු අතර මෙවැනි අර්බුදකාරි තත්වයක් පිළිබඳ එතුමාගේ මන්ත්‍රී කාලය තුල මුහුණ දී නොමැති බවත් පවසන ලදි.  මේ වන විට ලක්ෂ 1700ක වත්කමක් සභාව එක් රැස් කරගෙන තිබුනද 40% කපා හරින ගැටලුවට ආණ්ඩුව විසින් ගත් එම තීරණය වැරදි බවට යෝජනාවත් ගෙන එන ලෙස ඉල්ලා සිටි අතර ප්‍රාදේශිය සභාව යනු ප්‍රාථමික මට්ටමේ ආයතනයක් වන අතර එය ජනතාවට සේවය කරන ආයතනයක් බව ප්‍රකාශ කරන ලදි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට වඩා ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරයෙකු ජනතාව සමඟ ගැටෙන ප්‍රමාණය වැඩි බැවින් එම ගැටලු ඍජුවම ප්‍රාදේශිය සභා  මන්ත්‍රීවරුන් වෙත එල්ල වන අතර ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය පැවසූ ආකාරයට සිරිගම්පල ජනපදය ආසියාවේ විශාලකම ජනපදය වන අතර එම ජනතාවගේ ජන ජීවිතය බොහෝම අඩාල තත්වයක පවතින අතර එම ජනතාවගෙන් රු.200 මුදලක් අය කිරීම පිළිබඳව එතුමාගේ විරෝදතාවයක් පවතින බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මහතා කතා කරමින්, ඉහත කසල එකතු කිරීමට අදාල යෝජනාවේදි යෝජනා වී ඇත්තේ කසල ලබා දෙන නිවෙස් වලින් රු.200ක් අය කිරීම වන අතර එය සෑම නිවසකටම වලංගු කරුණක් නොවන බව පවසන ලදි. එමෙන්ම ට්‍රැක්ටර් රථ වලට කසල ලබා දීමේදි යම් මුදලක් ලබා දීමට ජනතාව විසින්ම පැවසූ අතර මේ වන විට ඇතැම් මාර්ග වල වෙසෙන ජනාතාව එම කසල ලබා දීම ක්‍රමවත්ව සිදු කරන අතර ඒ පිලිබඳ ජනතාව පැහැදීමකින් සිටින බවත් පවසන ලදි. එම නිසා රු.200ක මුදලක් කසල රැස් කරන නිවෙස් වලින් ලබා ගැනීම සාධාරණ වන බව පවසන ලදි. එමෙන්ම මීට පෙරත් මුදල් එකතු කිරීමේ කටයුත්ත ට්‍රැක්ටර් රථවල ගමන් කල සේවකයින් විසින්ම සිදු කල අතර එය අලුතින් සිදු වන දෙයක් නොවන බවත් පවසන ලදි. මීට පෙර මුදල් අය කිරීම සිදු වී ඇත්තේ වසරකට වරක් වූ අතර මුදලක් එකතු නොකර කසල රැස් කිරීමෙන් ජනතාව මාර්ග දෙපස කසල දමා යාමට ඉඩ ඇති බවද පවසන ලදි.

ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මහතා කතා කරමින්, කර්මාන්තපුරය ආශ්‍රිත ජනපද වලින් කසල ලබා දෙන්නේ නිවෙස් 15-20 ප්‍රමාණයක් වන බව පවසන ලදි. ඒ පිළිබඳව ජනාතාවගෙන් විමසීමේදී ඔවුන් මුදල් අය කිරීම පිළිබඳව ඇති බිය නිසා කසල ලබා නොදීම හේතුවක් වී ඇති බව පවසන ලදි. කර්මාන්තපුරය ආශ්‍රිතව විශාල වශයෙන් බෝඩිම් නිවාස ඇති බැවින් අක්‍රමවත් ලෙස කසල මාර්ගය දෙපස හා ඇලවල් වෙත මුදා හැර ඇති අතර මේ පිළිබඳ ජනපද ආශ්‍රිත ජනතාව දැනුවත් කිරීමක් සිදු කර ඉන්පසු එම වරිපනම් මුදල අය කිරීමේ කටයුත්තට එළැඹීස සුදුසු බව යෝජනා කරන ලදි.

ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සංදීප් මහතා කතා කරමින්, නිවෙස් 3000ක් පලමු අවස්ථාව ලෙස ඉලක්ක කර ඇති අතර එයින් ලක්ෂ 72ක ආදායමකට ලඟා වීමට ඇති බව සාකච්ඡා කල බව පවසන ලදි. එහිදි එම ලක්ෂ 72න් 50%ක් එම කසල රැස් කරන සේවකයින්ට ලබා දීමට අදහස් කලේ ආදායම් පරීක්ෂක මහතුන්ට රාජකාරි බහුල බැවින් එම කටයුත්ත නිසි ක්‍රියාවලියකට සිදු කිරීමටත් අවශ්‍ය බැවින් සහ සේවකයින්ගේ ආදායම් තත්වය මදක් උසස් කිරීම හේතුවෙන් මෙම යෝජනාව ගෙනා බව පවසන ලදි. එමෙන්ම මෙම ප්‍රාදේශිය සභාව ඉදිරියටත් ගෙන යාමේදි ස්වාධින ආයතනයක් බවට පත් කිරීමේ අදහසින් 20% වැටුප් ප්‍රතිපූරණය කිරීමේ ක්‍රමය පැමිණි බවත් පවසන ලදි. එය එසේ කිරීමට හේතුව නම් රාජ්‍ය ආයතනවල රාජ්‍ය වියදම්වල වියදම් පරතරයක් තිබීම බව පවසන ලදි. එහිදි සේවකයින් ලක්ෂ 15කට ආසන්න ප්‍රමාණයකට විශ්‍රාම වැටුප් වැටුප් සමඟ රජය වැටුප් ගෙවීමක් සිදු කරන අතර විශාල අයවැය පරතරයක් ඇති අතර වර්තමානය වන විට එම අයවැය හිඟය අවම කරමින යන බවත් අයවැය හිඟය තුල පවතින ණය ලබා ගැනීමේ පොලියක් අප අයතනවලට එල්ල වන බවත් ආයතනයක් ලෙස ස්වාධීනව උපයාගන්නා මුදලක් එම අයතනයට ලැබෙන අතර මෙම යෝජනාව තුලින් ආදායම් උත්පාදනය කිරීමට හැකියාවක් පවතින බවත් පවසන ලදි. එමෙන්ම සියලු මන්ත්‍රිවරු 44 දෙනාගේම සහ මහජනතාවගේ  සහයෝගය ඇතිව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් මෙම ප්‍රාදේශිය සභාව ඉදිරියට රැගෙන යා යුතු බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා කතා කරමින්, ජනපද නියෝජනය කරන මන්ත්‍රිවරයෙකු ලෙස ඉහත යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමට හේතුව පැහැදිලි කරන ලදි. මේ වන විට පසුගිය වසර කිහිපය තුල කසල රැස් කරන කම්කරුවන් වසර අවසානයේ සෑම නිවසකින්ම රු.500ක මුදලක් අය කර ගත් අතර මෙම වසරේදි ඉහත යෝජනාව ක්‍රියාත්මක වූවහොත්  ඊට සාපේක්ෂව වැඩි වන්නේ කලින් මුදලට සාපේක්ෂව සුළු මුදලක් වන බව පවසන ලදි. එමෙන්ම වර්තමානය වන විට ජනපද ආශ්‍රිත ජනතාවගේ බහුතර ප්‍රමාණයක් යම් ස්ථාවර මට්ටමක සිටින බැවින් අතීත මානසිකත්වයෙන් ජනදප දෙස බලා ඔවුන් පහතට දැමීම පිළිබඳව ජනපද නියෝජනය කරන මන්ත්‍රිවරයෙකු ලෙස විරුද්ධ වන බව පවසන ලදි. මේ වන විට ජනපද වල විදෙස්ගත වී සිටින බෝහෝ පිරිසක් සහ නිවෙස් ඉතා හොඳ මට්ටමකින් සාදා සිටින පිරිසක් සිටින බවද පැවසූ අතර යම් පවුලකට රු.200ක මුදලක් ගෙවීමට නොහැකි තත්වයක් පවතී නම් ඒ පිළිබඳව සොයා බලා සාධාරණ හේතුන් මත ඔවුන් නිදහස් කල හැකි බවද පවසන ලදි.

ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා පවසා සිටියේ ජනපද යන වචනය භාවිතා කලේ ජනතාව අපහසුතාවයට පත් කිරීමට නොව ඔවුන්ට සිදු වන්නට යන අසාධාරණයෙක් ඔවුන්ව ගලවා ගැනීමට බවයි.

ගරු සභාපතිතුමා කතා කරමින්, සේවකයින්ගේ දෛනික වැටුප සම්බන්ධයෙන් ගැටලුවක් පවතින අතර 50%ක් ලබා දීම විශාල ගැටලුවක් ලෙස නොදකින බව පවසන ලදි. එමෙන්ම ඇතැම් පිරිස් රු.200 මුදල් ගෙවීමට කැමැති බව බොහෝ අවස්ථාවලදි පවසා ඇති බවද පවසන ලදි. ඒ අනුව

මෙම යෝජනාව සම්බන්ධයෙන් ඇතැම් අය කැමැත්ත පල කරන විට තවත් ඇතැම් පිරිස් ඔවුන්ගේ අකමැත්ත ප්‍රකාශ කරන බවත් පවසන ලදි. මේ වන විට වරිපනම් කලාප තුල හිඟ ආදායම කෝටියක් වී ඇති බව පවසන ලදි. ජනපද ආශ්‍රිත කලාපය තුල මේ වන විට බොහෝ පිරිස් හොඳ ආදායම් තත්වයක සහ හොඳ ජීවන රටාවක් ගෙවන පිරිස් සිටින බවද පවසන ලදි. ඔවුන් සමඟ සාකච්ඡා කිරීමේදි ප්‍රාදේශිය සභාවෙන් කසල වෙන් කර ලබා ගැනීම සම්බන්ධයෙන් කැමැත්ත ප්‍රකාශ කල බවද පවසන ලදි. මෙම සියලු කරුණු සලකා බලා මුදල හා ප්‍රතිපත්ති කාරක සභාවේදි මෙවැනි යෝජනාවක් ගත් බවත් එම යෝජනාවෙන් අඩු ආදායම් ලාභි ජනයාට තවත බරක් පැටවීමට මෙහි අරමුණ නොවන බව පවසන ලදි. ඒ අනුව රටක් ලෙස දියුණු වෙමින් හා වෙනස් වෙමින් යන ගමනේදි ජනතාව පිළිබඳ හඳුනාගැනීම් සිදු කරමින් කටයුතු කිරීමට සියලු දෙනාගේ සහයෝගය ඉල්ලා සිටින ලදි. ඒ අනුව මෙවැනි යෝජනාවන් ක්‍රියාත්මක කරමින් සභාවට ආදායම් උත්පාදනය කල යුතු අතර ජනතාවටද සේවයක් සැලසිය යුතු බව පවසන ලදි. සේවකයින්ට නිල ඇඳුමක් ලබා දී වෘත්තීමය කම්කරුවෙකු ලෙස සේවයේ යෙදවීමට අවශ්‍ය කටයුතු සලසා දීමට මීළඟ වසරේ අයවැය සකස් කරමින් පවතින බව පවසන ලදි. ඒ අනුව වැඩ කම්කරු ලෙස පහත් නොකර මීලඟ වසරේ සිට වෘත්තීමය කම්කරුවෙකු ලෙස සමාජයට යාමට අවස්ථාව උදා කර දෙන බව පවසන ලදි. එවිට ඔවුන්ට සමාජය තුලින් ගෞරවයක් ලැබෙන බව පවසන ලදි. එසේ කිරීමට නම් සභාවට ආදායම් තිබිය යුතු අතර මෙම යෝජනාව තුලින් ඒ සඳහා මුදල් උත්පාදනය කල හැකි බවත පවසන ලදි.

ඒ අනුව ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා මෙම යෝජනාව සම්බන්ධයෙන් ඡන්ද විමසීමක් අවශ්‍ය බව පැවසූ අතර පැමිණි සිටි සියලු මන්ත්‍රීවරුන්ගෙන් සහ මන්ත්‍රීවරියන්ගෙන් ඡන්ද විමසීමක් කරන ලදි. ඉහත යෝජනාවට පක්ෂව ගරු සභාපති ටී.බී.ඩී.ඇන්ටනි කුමාර් මහතා, ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා, ගරු මන්ත්‍රී කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා, ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා, ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය, ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා , ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා, ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා, ගරු මන්ත්‍රී ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයා, ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මයා, ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය, ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය, ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා, ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය, ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා, ගරු මන්ත්‍රී කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සන්දීප් මයා, ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා, ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය, ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා සහ ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා ඡන්දය ප්‍රකාශ කල අතර යෝජනාවට විරුද්ධව ගරු මන්ත්‍රී ඩබ්.ඇලේක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී බී.ඒ.එස්. සාන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා, ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ආර්.ෂවීන් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය, ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා, ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා, ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය, ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය, ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රන්තිලක මිය, ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා, ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා සහ ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මයා ඡන්දය ප්‍රකාශ කරන ලදි. ඒ අනුව ඉහත යෝජනාවට පක්ෂව ඡන්ද 25ක් ලැබුණු අතර විපක්ෂව ඡන්ද 18ක් ලැබුණි. ඒ අනුව වැඩි ඡන්ද 7කින් යෝජනාව සම්මත විය.

3) දංකොටුව නගර ශාලාවේ ශබ්ද විකාශන පද්ධතිය හා තිර රෙදි යෙදීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා විසින් ස්ථිර කරන ලදි.

ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය විසින් තර රෙදි සහ ශබ්ද විකාශන පද්ධති සඳහා කුමන ආයතනයකින් හෝ මිල ගණන් කැඳවීමක් සිදු කර ඇත්දැයි විමසන ලදි. ගරු සභාපතිතුමා පවසා සිටියේ දැනට ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර තිර රෙදි සඳහා දංකොටුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ඒ සඳහා ඇසිත්මෙන්තුවක් පියවා දෙන බවට දැනුම් දී ඇති බවත් මේ වන විට එම ඇස්තමේන්තුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට යවා ඇති බවත් පවසන ලදි. එමෙන්ම ශබ්ද විකාශන යන්ත්‍ර ගෙනවිත් ඇති අතර ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට ඇති බවත් පවසන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

4) ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනයේ ගාස්තු සංශෝධනය හා 2026 වර්ෂය සඳහා ගාස්තු/ බදු පැනවීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. මෙම ගාස්තු සංශෝධනය පිළිබඳ පැහැදිලි කිරීමට ලේකම්තුමාට අවස්ථාවක් ලබා දීම සඳහා මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත්කිරීම සඳහා ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මහතා යෝජනා තල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු ලේකම්තුමා විසින් මේ පිළිබඳ පැහැදිලි කරන ලදි. ඉන්පසු නැවත් කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

| විස්තරය | කාලය | රජයේ පාසල් | | වෙනත් ආයතන | |
|---|---|---|---|---|---|
| | | බල ප්‍රදේශය(රු.) | පිටත (රු.) | බල ප්‍රදේශය(රු.) | පිටත(රු.) |
| ක්‍රිකට් | දිනකට | 6500.00 | 12000.00 | 15000.00 | 22000.00 |
| මළල ක්‍රීඩා | දිනකට | 18000.00 | 22000.00 | 25000.00 | 30000.00 |
| | අමතර දිනකට | 15000.00 | 18000.00 | 20000.00 | 25000.00 |
| නෙට් බෝල් / වොලිබෝල් | පුහුණු තරඟ සඳහා එක් පිටියක් | 3000.00 | 4000.00 | 5000.00 | 7000.00 |
| | තරඟාවලි (වෙළඳ හා රාජ්‍ය ලාභ නොලබන රාජ්‍ය ආයතන සඳහා 50%ක්) | - | - | 70000.00 | 100000.00 |
| එල්ලේ | දිනකට | 12000.00 | 20000.00 | 30000.00 | 50000.00 |
| පාපන්දු / හොකී | තරඟයක / තරඟාවලියක එක් පිටියක් සඳහා | 10000.00 | 15000.00 | 20000.00 | 30000.00 |
| ක්‍රීඩා පුහුණු කඳවුරු | දිනකට | 5000.00 | 10000.00 | 15000.00 | 20000.00 |
| සුහද හමුවීමේ | දිනකට | 25000.00 | 30000.00 | 50000.00 | 100000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| උත්සවය (ලාභ නොලබන රාජ්‍ය ආයතන සඳහා 50%ක්) | | | | | |

* ඒ ඒ තරඟාවලි සඳහා ඉහත එක් එක් මුදලට සමාන අගයක ආපසු ගෙවන ඇප තැන්පතුවක් හා උපරිමය රු. 50000.00ක ඇප තැන්පතුවක් තැබිය යුතුය.

- **ශ්‍රීමත් ඇල්බට් පීරිස් ගෘහස්ත ක්‍රීඩාංගනයේ ගාස්තු අයකිරීම.**

➢ **පුහුණු තරඟ සඳහා.**

| **විස්තරය** | **කාලය** | **රජයේ පාසල්** | | **ක්‍රීඩා සමාජ / ආයතන** | |
|---|---|---|---|---|---|
| | | **බල ප්‍රදේශය(රු.)** | **පිටත (රු.)** | **බල ප්‍රදේශය(රු.)** | **පිටත (රු.)** |
| අත් පන්දු / වොලිබෝල් | පැය 01 | 1250.00 | 1500.00 | 2000.00 | 2500.00 |
| බැඩ්මින්ටන් | පැය 01 | 350.00 | 450.00 | 500.00 | 600.00 |
| පැසි පන්දු | පැය 01 | 1000.00 | 1500.00 | 1500.00 | 2000.00 |
| කරාතේ | පැය 01 | 500.00 | 600.00 | 600.00 | 1000.00 |

| **විස්තරය** | **කාලය** | **ආයතන** | |
|---|---|---|---|
| | | **බල ප්‍රදේශය (රු.)** | **පිටත (රු.)** |
| වෙනත් වැඩසටහන් (යෝග, ඇරබික්ස්, සුම්බා) | පැය 01 | 2000.00 | 2500.00 |
| නැටුම් පන්ති | පැය 01 | 2500.00 | 3000.00 |

➢ **ක්‍රීඩා තරඟාවලි සඳහා.**

| **විස්තරය** | **කාලය** | **රජයේ පාසල්** | | **ක්‍රීඩා සමාජ / ආයතන** | |
|---|---|---|---|---|---|
| | | **බල ප්‍රදේශය (රු.)** | **පිටත (රු.)** | **බල ප්‍රදේශය (රු.)** | **පිටත (රු.)** |
| වොලිබෝල් / අත් පන්දු / දැල් පන්දු | වරුවක් | 6500.00 | 10000.00 | 10000.00 | 15000.00 |
| | දිනකට | 12000.00 | 18000.00 | 20000.00 | 30000.00 |
| බැඩ්මින්ටන් | වරුවක් | 6500.00 | 12000.00 | 10000.00 | 15000.00 |
| | දිනකට | 15000.00 | 18000.00 | 20000.00 | 30000.00 |
| පැසි පන්දු | වරුවක් | 6000.00 | 10000.00 | 10000.00 | 20000.00 |
| | දිනකට | 10000.00 | 15000.00 | 15000.00 | 25000.00 |
| කරාතේ | වරුවක් | 15000.00 | 20000.00 | 25000.00 | 40000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දිනකට | 18000.00 | 35000.00 | 40000.00 | 60000.00 |

* පැය 08ට වැඩි වන සෑම පැයක් සඳහාම අදාල මුදලෙන් $^1/_8$ක් අයකළ යුතුය.
* බල ප්‍රදේශයේ තරඟාවලි සඳහාක්‍රීඩා සමාජ සහභාගී වීමේදී ක්‍රීඩා කණ්ඩායම් වලින් $^2/_3$ක් බල ප්‍රදේශයේ ක්‍රීඩා සමාජ විය යුතුය.

- **ශ්‍රීමත් ඇල්බට් පීරිස් පිහිනුම් තටාකයේ ගාස්තු අය කිරීම.**
- **පුහුණු වීම් සඳහා.**

| විස්තරය | ගාස්තුව (රු.) | තැන්පතුව |
|---|---|---|
| පාසල් ළමයෙකු සඳහා | 200.00 | පැය 2ක් සඳහා |
| වැඩිහිටියෙකු සඳහා | 400.00 | පැය 2ක් සඳහා |
| පිහිනුම් පුහුණු සැසි සඳහා (උපරිම ළමුන් සංඛ්‍යාව 20) | 5000.00 | පැය 2ක් සඳහා |

* එක් පවුලක එක් දරුවෙකුට පමණක් ගාස්තු අයකළ යුතුය.

- **පිහිනුම් තරඟාවලි සඳහා (දිනකට)**

| විස්තරය | ගාස්තුව (රු.) | තැන්පතුව (රු.) |
|---|---|---|
| බල ප්‍රදේශයේ පාසල් තරඟාවලි සඳහා | 45000.00 | 20000.00 |
| බල ප්‍රදේශයෙන් පිටත පාසල් තරඟාවලි සඳහා | 50000.00 | 20000.00 |
| බල ප්‍රදේශයේ වැඩිහිටි තරඟාවලි සඳහා | 50000.00 | 25000.00 |
| බල ප්‍රදේශයෙන් පිටත වැඩිහිටි තරඟාවලි සඳහා | 75000.00 | 25000.00 |

* තරඟාවලි සඳහා අමතර පැයක් සඳහා අයකිරීම රු. 2500.00යි.
* ළමුන් = වයස අවුරුදු 18ට අඩු / වැඩිහිටි = අවුරුදු 18ට වැඩි
* දිනක් සඳහා පැය 08ක කාලයක් සහ වරුවක් සඳහා පැය 04යි විනාඩි 30ක කාලයක් වශයෙන් සැලකිය යුතුය.

5) දැනට සභාව මඟින් අය කරන 10% ක විනෝද බදු ප්‍රතිශතය 5% දක්වා අඩු කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙහිදි ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා පවසා සිටියේ මෙම යෝජනාව කොමසාරිස් තුමාගේ අනුමැතියට යටත්ව සිදු කිරීම සුදුසු බවයි. එසේ නොමැති වුවහොත් එය සියලු දෙනාට ගැටලුවක් විය හැකි බව පවසන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, විනෝද බදු පසුගිය කාලය තුල නිසි අයුරින් අය වී නොමැති අතර ඇතැම් අවස්ථාවල සුළු මුදල ප්‍රමාණයක් ගෙවා ඇත අතර තවත් අවස්ථාවල මුළුමනින්ම බද්දෙන් නිදහස් කර ඇති බව පවසන ලදී. එම නිසා පෙර තිබූ 10% බදු ප්‍රතිශතය 5% දක්වා අඩු කිරීමෙන් සාධාරණ ලෙස මුදල් අය කර ගත හැකි අතර මහජනතාව මෙය ගෙවීමට පෙළඹෙන අතර කලින් අහිමි වී ගිය මුදල් ප්‍රමාණයද නැවත අත්පත් කර ගැනීමට හැකි වන බව පවසන ලදී. ඒ අනුව ඉදිරියේදි විවිධ ප්‍රසංග පවත්වන ස්ථානවල අධීක්ෂණ නිලධාරියාගේ අත්සන පමණක් නොව තවත් නිලධාරි මහතෙකු යොදවා විවිධ ප්‍රසංගය අවසාන වන තෙක් ටිකට් පත් පරික්ෂා කිරීමට යෙදවීමට බලාපොරොත්තු වන බවද පවසන ලදී. එමඟින් කිසිවෙකුට බදු මුදලින් පැනයාමට අවස්ථාවක් නොලැබෙන අතර සියලු දෙනාටම බදු මුදල් ගෙවා නීත්‍යානුකූල සහ ගෞරවනීය ලෙස කටයුතු කිරීමට හැකි වන බව පවසන ලදී. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

6) ඇල්බට් ඈෆ් පීරිස් ක්‍රීඩාංගනය එල්ලේ තරඟ සඳහා ලබා දීමේදි අනුගමනය කල යුතු ක්‍රමවේදය තීරණය කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, ක්‍රීඩාංගනය අවට ජනතාවගෙන් එල්ලේ ක්‍රීඩාව පැවැත්වීම සම්බන්ධයෙන් දැඩි විරෝධයක් පවතින අතර ක්‍රීඩාංගනය ඇතුලේදීත් සංවිධායක මණ්ඩලයට පවා පාලනය කල නොහැකි තත්වයක් පවතින බව පවසන ලදි. මෙලෙස ප්‍රදේශයේ ඇති විශාලම ක්‍රීඩාංගනයක් වන ඇල්බට් ඈෆ් පීරිස් ක්‍රීඩාංගනය ඉදිරයේදි නවීනකරණය කිරීමට බලාපොරොත්තු වන අතර එල්ලේ ක්‍රීඩාව සිදු කිරීමට සම්බන්ධයෙන් ප්‍රායෝගික ගැටලුවක් ලවතින බව පවසන ලදි. ඒ අනුව මන්ත්‍රිවරුන් හා මන්ත්‍රිවරියන්ගේ අදහස් මේ සම්බන්ධයෙන් විමසන ලදි. ඒ අනුව මේ සම්බන්ධයෙන් ලේකම්තුමාගෙන් පැහැදිලි කිරීමක් කර ගැනීමට මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මහතා ස්ථිර කරන ලදි. ඉන්පසු මේ පිළිබඳ ලේකම්තුමා විසින් පැහැදිලි කරන ලදි. නැවත කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රන්තිලක මිය විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මසකට එක් අවසන් තරඟාවලියක් පැවැත්වීමට අවසර ලබා දෙන අතර ජාතික මට්ටමේ තරඟාවලියකට පමණක් තරඟ අවස්ථා 02ක් ලබා දීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

7) වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ සතිපොල/පොදු වෙළඳපොල සඳහා සකස් කර ඇති උපදෙස් මාලාව අනුමත කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

8) මැටිකොටුව සිරි සුදස්සනාරාම විහාරස්ථානයට අනුබද්ධ දහම් පාසල සඳහා ඩෙස්ක් බංකු මිලදී ගැනීම සඳහා ආධාර මුදලක් ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි.

ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා කතා කරමින්, මෙම යෝජනාව ඉතාම කාලෝචිත වන අතර මෙවැනි යෝජනාවන් පන්සලට පමණක් ලගු නොකර දේවස්ථාන හා කෝවිල් වලටද අවශ්‍යතාවයන් බලා සපුරා දීම සුදුසු බව පවසන ලදි. එමෙන්ම ඇතැම් අවස්ථාවලදි අසාධාරණ ලෙස ඉදිරිපත් කරන යම් යෝජනාවන්ද ඇති බව පවසන ලදි. එනම් අවමංගල්‍ය අවස්ථාවකදි පානීය ජලය ලබා ගැනීමට ඉල්ලුම් කලද එය නොමිලේ ලබා නොදී මුදල් අය කිරීම පිළිබඳව කණගාටුව එල කරන ලදි. එමෙන්ම් එලෙස මුදල් අය කිරීම අසාධාරණ වන බවද පවසන ලදි.

එමෙන්ම කිරිමැටියාන, තුලාවල, බෝතලේගම, හුන්දිරාපොල, කටුකෙන්ද, ඇටියාවල සහ දංකොටුව ප්‍රදේශයන්වල විශාල වශයෙන් බෞද්ධ ජනතාව ජීවත්වන අතර වසරක් පාසා පවත්වන වෙසක්, පොසොන් දන්සැල් සඳහා පානීය ජලය ලබා දුන්නේද ප්‍රාදේශිය සභවෙන් වන අතර ඒ සඳහා මුදලක් අය කිරීම අසාධාරණ කටයුත්තක් වන බව පවසන ලදි. ඒ අනුව එලෙස් කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් විරෝධතාවය එල කරන බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මහතා පවසා සිටියේ ආගමික ස්ථාන සඳහා වසරකට ලබා දිය යුතු පොදු මුදලක් තීරණය කිරීම සුදුසු බවත් එසේ නොමැති වුවහොත් ඉදිරියේද එය ගැටලුවක් විය හැකි බවද පවසන ලදි.

ඒ අනුව මේ පිළිබඳව ලේකම්තුමාගෙන් විමසීම සඳහා මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු ලේකම්තුමා විසින් මේ පිළිබඳ පැහැදිලි කරන ලදි. නැවත කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මහතා විසින් ස්ථිර කරන ලදි. ඒ අනුව රු.25,000.00 ක මුදලක් ලබා දීමට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

9) වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව සතු දේපල 2026 වර්ෂයට බදු දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මහති විසින් ස්ථිර කරන ලදි.

මේ පිළිබඳ ලේකම්තුමාගෙන් පැහැදිලි කිරීමක් අවශ්‍ය බැවින් මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් තිරීම සඳහා ගරු සභාපත්තිමැ විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු ලේකම්තුමා විසින් ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් සිදු කරන ලදි. නැවත කිරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

10) වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව සතු සතිපොළ භූමිවල වෙළඳාම් කරන වෙළඳුන් වෙතින් හා වාහන නැවතුම් ස්ථාන වලින් 2026 වර්ෂය සඳහා අයකල යුතු ගාස්තුව අනුමත කර ගැනීම හා සතිපොළ ගාස්තු සභාවේ නිලධාරින් මගින් රැස් කිරීමට අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

| අ.අ | සතිපොළේ නම | ස්ථානය | දික් අඩි / වර්ග අඩි | මුදල |
|---|---|---|---|---|
| 1 | වෙන්නප්පුව සතිපොළ | පොළ තුල ගොඩනැගිල්ල ඉදිරියේ, පිවිසුම් මාර්ගයේ දෙපස තාවකාලික කඩ | දික් අඩි 1 | රු. 100.00 |
| | | පොළ පිටුපස තාවකාලික කඩ | දික් අඩි 1 | රු. 50.00 |
| | | ප්‍රධාන වෙළඳකුටි අතරමැද කඩ | දික් අඩි 1 | රු. 60.00 |
| | | ප්‍රධාන වෙළඳකුටි ආරම්භක ස්ථානයේ රෙදි කඩ | දික් අඩි 1 | රු. 80.00 |
| | | A ගොඩනැගිල්ලේ රෙදි කඩ | | රු. 3,000.00 |
| | | B ගොඩනැගිල්ලේ රෙදි කඩ | | රු. 1,500.00 |
| | | C,D,E ප්‍රධාන ගොඩනැගිලි වල කඩ කාමර | 15 x13 | රු.3,200.00 |
| | | | 15 x6 | රු. 1,600.00 |
| | | F ප්‍රධාන ගොඩනැගිල්ල තුළ කඩ කාමර | 15 x13 | රු. 2600.00 |
| | | | 15 x6 | රු. 1,300.00 |
| | | ජංගම වෙළඳුන් එක් අයකුට | | රු. 100.00 |

| | | | | |
|---|---|---|---|---|
| 2 | දංකොටුව සතිපොළ | සියළුම ප්‍රධාන ගොඩනැගිලිවල ඕනෑම ස්ථිර වෙළඳ කුටි ඉදිරිපස කඩ කාමර | 12x12 | රු.1,250.00 |
| | | සියළුම ප්‍රධාන ගොඩනැගිලිවල ඕනෑම ස්ථිර වෙළඳ කුටි පිටුපස කඩ කාමර | 12x12 | රු. 1,000.00 |
| | | සතිපොළ පරිශ්‍රයේ ඉදිරිපස ඕනෑම ස්ථානයක කාවකාලික කඩ | දික් අඩි 1 | රු. 50.00 |
| | | සතිපොළ පරිශ්‍රයේ දකුණුපස හා පිටුපස ඕනෑම ස්ථානයක තාවකාලික කඩ | දික් අඩි 1 | රු. 40.00 |
| | | ජංගම වෙළඳුන් එක් අයකුට | | රු. 50.00 |
| 3 | බයිසිකල් නැවතුම්පොළ | යතුරුපැදි 1 | | රු. 30.00 |
| 4 | ලිහිරියාගම සතිපොළ | තාවකාලික කඩ | දික් අඩි 1 | රු. 50.00 |
| | | ගොඩනැගිල්ල තුළ වෙළඳකුටි | 6 x7 | රු. 250.00 |
| | | මාළු වෙළඳකුටිය | | රු. 850.00 |
| | | කුකුල් මස් කඩය | | රු. 800.00 |
| | | කහටවිල දේවාල පාරට මුහුණලා ඇති වෙළඳකුටි | | රු. 550.00 |
| 5 | සිරිගම්පළ සතිපොළ | A ගොඩනැගිල්ලේ එක් වෙළඳ කුටියක් | 7x9 | රු. 350.00 |
| | | B ගොඩනැගිල්ලේ එක් වෙළඳ කුටියක් | 7x7 | රු. 250.00 |
| | | C ගොඩනැගිල්ලේ එක් වෙළඳ කුටියක් | 8x9 | රු. 200.00 |
| | | D ගොඩනැගිල්ලේ එක් වෙළඳ කුටියක් | 10x10 | රු. 400.00 |
| | | E වෙළඳ කුටිය | 6x14 | රු. 300.00 |
| | | F වෙළඳ කුටිය | 7x11 | රු. 300.00 |
| | | G වෙළඳ කුටිය | 8x7 | රු. 450.00 |
| | | තාවකාලික කඩ | දික් අඩි 1 | රු. 50.00 |
| | | ජංගම වෙළඳුන් එක් අයකුට | | රු. 50.00 |
| 6 | කිරිමැටියාන සතිපොළ | ප්‍රධාන ගොඩනැගිල්ලේ ඕනෑම ස්ථිර වෙළඳ කුටියක් | | රු. 900.00 |
| | | සතිපොළ පරිශ්‍රයේ ඉදිරිපස ඕනෑම ස්ථානයක කාවකාලික කඩ (බයිට්, රස කැවිලි සහ රෙදි කඩ ඇතුළුව) | දික් අඩි 1 | රු. 50.00 |
| | | ජංගම වෙළඳුන් එක් අයකුට | | රු. 50.00 |

11) 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය සඳහා අයදුම්පත් කැඳවීමට අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.ඩිහාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

12) 2025 අයවැය ප්‍රතිපාදන යටතේ ඉදි කිරීමට යෝජිත ප්‍රතිචක්‍රීකරණය කල නොහැකි අපද්‍රව්‍ය දහනය කිරීම සඳහා දාහකයක් ඉදි කිරීමට උපදේශන ඉංජිනේරු සේවාව ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය වෙතින් ලබා ගැනීමට සහ ඒ සඳහා නියමිත ගාස්තු ගෙවීමට අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

13) පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ඉදි කිරීමට යෝජිත මල අපද්‍රව්‍ය පිරිපහදු ව්‍යාපෘතිය සඳහා උපදේශන ඉංජිනේරු සේවාව මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යංශය වෙතින් ලබා ගැනීමට අදාල යෝජනාවට අදාල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඒ.චොහාන් සංදීප් මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

14) 2025 අයවැය ප්‍රතිපාදන යටතේ වැසිකිලි ඉදිකිරීමට ආධාර ලබා දීමට අනුමැතිය ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපිතුමා විසින් ඉදිරිපත් කරන ලදි.

1. ආර්.ඒ.උපුල් නිශාන්ත - ඇටඹගහවත්ත,සෙනදිරියාමුල්ල - රු.100,000.00

මේ පිළිබඳ ලේකම්තුමාගෙන් කරුණු විමසීම සඳහා මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු ලේකම් තුමා විසින් ඒ පිළිබඳ පැහැදිලි කරන ලදි. නැවත් කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඒ අනුව එම පුද්ගලයාට රු.100,000.00 ක මුදලක් ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

15) දංකොටුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ 2025 වැඩිහිටි සැමරුම් උත්සවය සඳහා සභා අරමුදලින් රු.150,000.00ක් ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

16) සභාව සතු තඹරවිල ගමේ පිහිටි ඔප්පු අංක 706 දරණ ඉඩමේ ප්‍රජාශාලාවක් ඉදි කිරීම සඳහා අනුමැතිය ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම

යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ ඒකඟතාවයෙන් සම්මත විය.

17) අසරණ තත්වයට පත් වී සිටින ද/සිරිගම්පල ලුණුවිල පදිංචි එම්.රමණී ප්‍රනාන්දු මියට ස්වයං රැකියාවක් ආරම්භ කිරීම සඳහා සභා අරමුදලින් රු.25,000.00ක ආධාර මුදලක් ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුක් සුසන්ත අප්පුහාමි මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ ඒකඟතාවයෙන් සම්මත විය.

18) කමිටු රැස්වීම වලට සහ මහ සභාවට සහභාගි නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ ඒකඟතාවයෙන් සම්මත විය.

| අනු අංකය | මන්ත්‍රීවරයාගේ නම | කාරක සභාව/මහ සභාව | දිනය |
|---|---|---|---|
| 1 | ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මහතා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.08.20 |
| 2 | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.08.20 |
| 3 | ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මහතා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.08.20 |
| 4 | ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.08.20 |
| 5 | ගරු මන්ත්‍රී කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා | කාර්මික සේවා කාරක සභාව | 2025.08.19 |
| 6 | ගරු මන්ත්‍රී ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයා | පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව | 2025.08.21 |
| 7 | ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා | පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව | 2025.08.21 |
| 8 | ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා | පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව | 2025.08.21 |
| 9 | ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මයා | පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව | 2025.08.21 |
| 10 | ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා | පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව | 2025.08.21 |
| 11 | ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා | පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව | 2025.08.28 |
| 12 | ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.08.22 |
| 13 | ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ආර්.ෂවීන් ප්‍රනාන්දු මයා | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.08.22 |
| 14 | ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.08.22 |

| | | | |
|---|---|---|---|
| 15 | ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.08.22 |
| 16 | ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.08.22 |
| 17 | ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රමයලතා මිය | මහ සභාව | 2025.09.09 |

19) ආසියානු ප්‍රවීණයන්ගේ මළල ක්‍රීඩා තරගාවලියකට සහභාගී වීම සඳහා ඩබ්.ධම්මිකා පෙරේරා මහත්මිය වෙත ආධාර මුදලක් ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ලදි. මේ පිළිබඳ පැහැදිලි කිරීමට ලේකම් තුමාට අවස්ථාව ලබා දීම සඳහා මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවකි බවට පත් කිරීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන් පසු ලේකම් තුමා විසින් මේ පිළිබඳ පැහැදිලි කරන ලදි. ඉන්පසු නැවත කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය විසින් ස්ථිර කරන ලදි. ඒ අනුව ඉහත නම් සඳහන් ක්‍රීඩිකාව වෙත රු.15000.00ක ආධාර මුදලක් ලබා දීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

20) ටෙන්ඩර් මණ්ඩලය සංශෝධනයට අදාලව ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා ඇතුළු මන්ත්‍රිවරුන් හා මන්ත්‍රිවරියන් විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් මෙම යෝජනාව සංශෝධන යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින් ටෙන්ඩර් මණ්ඩලට යනු ප්‍රාදේශිය සභාවේ උපසම්පාදන කටයුතු සිදු කිරීමේද අදාල වන කාණ්ඩය බව පවසන ලදි. එහිදි කිසිදු විපක්ෂ මන්ත්‍රිවරයෙකු එම යෝජනාව සම්මත කිරීමට ඉදිරිපත් නොවූ අතර මේ පිළිබඳ සලකා බලා තීරණයක් ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි.

එලෙසම 2025.06.13 මහ සභා වාර්ථාවේ "සංශෝධනය විය යුතුයි" යනුවෙන් කරුණු දෙකක් පැවසූ අතර එම යෝජනාවද ගරු උප සභාපතුතිමා විසින් ස්ථිර කර ඇති අතර එයද යෝජනාවක් ගෙස ඉදිරිපත් වන බැවින් 2025.06.27 දින පැවැත්වූ මහ සභා වාරයේදි නම්කල මන්ත්‍රිවරු දෙදෙනාව ටෙන්ඩර් මණ්ඩලයට ඇතුලත් කල නොහැකි බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශයක් කල අතර එම ප්‍රකාශය ඒකමතිකව සම්මත වූ බවට වාර්ථාගව වී ඇති අතර එය සභා වාර්යෙන් වාරයට තල් නොදැමිය යුතු අතර මෙය නිවැරදි ලෙස සම්මත කර ගනිමින් ඉදිරියට යාම සුදුසු බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා කතා කරමින්, 2025.06.19 දින ප්‍රකාශයට අනුව මන්ත්‍රිවරුන් 5 දෙනෙකුගේ අත්සනින් යුතු ලිපිය ලබ් දී ඇති බැවින් මේ පිළිබඳ සලකා බලන ලෙස ඉල්ලා සිටින ලදි. එමෙන්ම එම ක්‍රියාවලිය චන්ද විමසීමකින් තොරව සිදු වූවක් බවද ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, විශේෂ මහ සභාව තුලදී කිසිදු අයෙක් ඡන්ද විමසීමක් ඉල්ලා නොසිටි අතර එය ඉල්ලා සිටියේ නම් ඡන්ද විමසීමකට යා හැකිව තිබූ බව පවසන ලදි. ඒ අනුව ටෙන්ඩර් මණ්ඩලයට තවත් එක් අයෙකුව නම් කිරීමට මන්ත්‍රී මණ්ඩලයට අවස්ථාවක් ලබා දෙන බවද පවසන ලදි. ටෙන්ඩර් මණ්ඩල සංශෝධනයට අදාල යෝජනාව සම්බන්ධයෙන් ඡන්ද විමසීමක් අවශ්‍ය බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා පවසන ලදි. යෝජනාවට පක්ෂව ගරු මන්ත්‍රී ඩබ්.ඇලේක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී බී.ඒ.එස්. සාන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා, ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ආර්.ෂවීන් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය, ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා, ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා, ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය, ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය, ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රත්තිලක මිය, ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා, ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා සහ ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මයා ඡන්දය ප්‍රකාශ කරන ලදි. යෝජනාවට විරුද්ධව ගරු සභාපති ටී.බී.ඩී ඇන්ටනී කුමාර් මහතා, ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා, ගරු මන්ත්‍රී කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා, ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා, ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය, ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා , ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා, ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා, ගරු මන්ත්‍රී ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයා, ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මයා, ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය, ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය, ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා, ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය, ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා, ගරු මන්ත්‍රී කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ.චොහාන් සන්දීප් මයා, ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා, ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය, ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා සහ ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා ඡන්දය ප්‍රකාශ කරන ලදි. ඒ අනුව ඉහත යෝජනාවට පක්ෂව ඡන්ද 18ක් ලැබුණු අතර විපක්ෂව ඡන්ද 25ක් ලැබුණි. ඒ අනුව ටෙන්ඩර් මණ්ඩල සංශෝධනයට අදාල යෝජනාව සම්මත නොවන බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

21) සීමාසහිත සමගි සමූහ ව්‍යාපාරය විසින් වෙන්නප්පුව බස් නැවතුම්පොළ අසල දැන්වීම් පුවරුව සඳහා ගාස්තු ගෙවා ඇති බැවින් එය සවි කිරීමට අවසර ලබා දීම සුදුසු බවට ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා ඇතුළු මන්ත්‍රිවරුන් හා මන්ත්‍රිවරුයන් විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඒ අනුව මෙම කරුණ සම්බන්ධයෙන් ලේකම්තුමාගෙන් පැහැදිලි කිරීමක් අවශ්‍ය බැවින් මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීමට ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඒ අනුව ලේකම්තුමා විසින් ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් සිදු කරන ලදි.

සීමාසහිත සමගි සමූහ ව්‍යාපාරය විසින් ලිපියක් නැවත වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවට එවා ඇති අතර එම ලිපිය සභාගත කරන ලෙසද ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා විසින් පවසන ලදි. එහිදි ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙය විමර්ශණ නිලධාරින්ගෙන් අවශ්‍ය සියලුම නීතිමය උපදෙස් ලබා ගනිමින් අවසන් තීරණය ඔවුන්ට ලබා දී ඇති බවයි . ඒ අනුව ඕනෑම අයෙකුට

ප්‍රාදේශිය සභාව විසින් ගත් තීරණයකට අභියෝග කරමින් අධිකරණයට යාමේ අයිතිය ඇති බව පවසන ලදි.
ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා පවසා සිටියේ එලෙස අත්තනෝමතික තීරණ වලට එළැඹීම නුසුදුසු බවයි.

ඒ අනුව ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, මෙම සිද්ධිය මන්ත්‍රී මණ්ඩලය බලයට පත් වීමට පෙර සිදු වූවක් බැවින් එම ව්‍යාපාරික මහතා ප්‍රාදේශිය සභාව සමඟ එදිනෙදා ගණුදෙනු සිදු කරන මහත්මයෙක් වන අතර එම මහතාට කීර්ති නාමයක් ඇති අතර වෙන්නප්පුව ප්‍රාදේශි සභාවටද කීර්ති නාමයක් ඇති බව පවසන ලදි. ඒ අනුව මෙලෙස එක් එක් අවස්ථාවන්වලදී තීරණ වෙනස් කරමින් පාරිභෝගිකයින්ව අපහසුතාවයට පත් කිරීම නුසුදුසු බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මහතා කතා කරමින්, ව්‍යාපාරික ප්‍රජාව සමඟ කල සාකච්ඡාවේදී සීමසහිත සමඟි සමූහ ව්‍යාපාරයේ අධිපති මහතා මිනිත්තු 15-20 ක පමණ කාලයක කථාවක් පැවැත්වූ අතර ඉහත සාකච්ඡා කල කරුණ සම්බන්ධයෙන් කිසිදු දෝෂාරෝපණයක් සිදු නොකල බව පවසන ලදි. එම ව්‍යාපාරික මහතා විසින් "ලංකාවේ එවකට පැවති දේශපාලනය අවසානයේ සංස්කෘතිය සකසා තිබුනේ මුදල් රැගෙන සාක්කුවේ දමාගෙන ගෙදර යන ආකාරයට බවත් එකල සිටි සභාපතිවරුන් ඕනෑ තරම් එය සිදු කල අතර වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේද වෙනසක් සිදු නොවීය" යනුවෙන් ප්‍රකාශයක් කල බව ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මහතා පවසන ලදි. එපමණක් නොව එම ව්‍යාපාරික මහතා විසින් නව ආණ්ඩුව බලයට පත් වීමෙන් පසු වර්තමානයේ සිදු වෙමින් පවතින පාලන ක්‍රමය පිලිබඳ දැඩි කැමැත්තකින් සහ ප්‍රශංසනීය අයුරින් කතා කල බවද ප්‍රකාශ කරන ලදි. එමෙන්ම වංචාවෙන් හා දූෂණයෙන් තොර කණ්ඩායමක් පත් වීම පිළිබඳවද එම මහතා සතුට ප්‍රකාශ කල බව බව ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මහතා විසින් පවසන ලදි. එලෙස සුපිරිසිදු දේශපාලන කණ්ඩායමක් බලයට පත් වීම පිළිබද තමාගේ සතුට තුන් වරක් ප්‍රකාශ කල බවත් වත්මන් ගරු සභාපති ටී.බී.ඩී ඇන්ටනී කුමාර් මහතාව විශේෂයෙන් ස්තුති කල බවද පවසන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා විසින් "අත්තනෝමතික ලෙස කටයුතු කිරීම නුසුදුසු" යැයි ලෙස ප්‍රකාශ කලද සැබැවින්ම අත්තනෝමතික ලෙස කටයුතු කලා නම් මෙම ගැටලුව සම්බන්ධයෙන් කාර්මික කමිටුවෙන් තීරණයක් ගත් පසු නැවතත් සියලු දෙනා සමඟ සාකච්ඡා කිරීමට මහ සභාවට යොමු නොකරන බව පවසන ලදි. එම නිසා මෙවැනි වැරදි ප්‍රකාශ කිරීමෙන් වලකින ලෙස පවසන ලදි. සෑම යෝජනාවක්ම විනිවිදභාවයකින් යුතුව මහ සභාවට ඉදිරිපත් කරමින් මන්ත්‍රී මණ්ඩලයේ සෑම අයෙකුටම විවෘතව කතා කිරීමට අවස්ථාව ලබා දුන් අතර පාදඩ දේශපාලන ක්‍රමයෙන් හැසිරීම නුසුදුසු බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා කතා කරමින්, මේ සම්බන්ධයෙන් ඡන්ද විමසීමක් අවශ්‍ය බව පවසන ලදි. ඒ අනුව ඉහත යෝජනාවට පක්ෂව ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මයා, ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා, ගරු, මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා, ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.ෂවීන් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රිනී, ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය, ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා සහ ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා ඡන්දය ප්‍රකාශ කල අතර ඉහත යෝජනාවට විරුද්ධව ගරු සභාපති ටී.බී.ඩී ඇන්ටනී කුමාර් මහතා, ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා, ගරු මන්ත්‍රී කේ.ඩිහාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා,

ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා, ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා, ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය, ගරු මන්ත්‍රී සී.ජුඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා, ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා, ගරු මන්ත්‍රී ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයා, ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය, ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය, ගරු මන්ත්‍රී එම්.සුරංග රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා, ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය, ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා, ගරු මන්ත්‍රී කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ.චොහාන් සංදීප් මයා, ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය, ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා, ගරු මන්ත්‍රී බී. ඒ.එස්. සාන්ත පෙරේරා මයා සහ ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා ඡන්දය ප්‍රකාශ කරන ලදි. එමෙන්ම ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා, ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය, ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය, ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රන්තිලක මිය සහ ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැලකී සිටින ලදි.

| යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කල සංඛ්‍යාව | යෝජනාවට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කල සංඛ්‍යාව | ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැලකී සිටි සංඛ්‍යාව | සභා ගර්භයේ නොසිටි සංඛ්‍යාව | නොපැමිණි සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **11** | **25** | **5** | **2** | **1** |

ඒ අනුව ඡන්ද 14ක් ඉහත යෝජනාවට විරුදධව ඉදිරිපත් වූ බැවින් එම යෝජනාව සභා සම්මත නොවන බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

22) දිවා කාලයේ දැල්වී තිබෙන වීදි පහන් විසන්ධි කිරීමෙන් පසුව නැවත සක්‍රිය කිරීමේදි ගාස්තුවක් අය කිරීම සුදුසු නොවන බවට ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා ඇතුළු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, පසුගිය සභාවාරයකදි මෙම ක්‍රියාවලිය සිදු වන්නේ කුමන පදනම මතද යන්න ඇසූ පැනයට පිලිතුරු නොදෙමින් මෙම යෝජනාව ස්ථිර වූ බව පවසන ලදි. ඒ අනුව ප්‍රාදේශිය සභා පණතේ 108 වගන්තිය අනුව මෙලෙස මුදල් අයකර ගත නොහැකි අතර ඒ සඳහා අතුරු ව්‍යවස්ථාවක් ගෙන ඒම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා කතා කරමින්, දිවා කාලයේදි දැල්වී තිබෙන වීදි පහන් විසන්ධි කිරීමෙන් පසු සක්‍රිය කිරීමේදි ගාස්තුවක් අය කිරීමට අදාල යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද කිසිවක් සිදු නොවී සම්මත වූ අතර එය නිවැරදි නොවන බව පවසන ලදි. මෙහිදි වීදි පහන් නිවා දැමීම සම්බන්ධයෙන් මුදල් අය කර ගන්නේ කාගෙන්ද යන්න ගැටලුවක් පවතින බව පවසන ලදි. එයට හේතුව නම් එක් එක් වීදි පහන් කණුවට අදාලව නියෝජිතයෙකු නොසිටින නිසාවෙනි. මෙහිදි කිසිවෙකුටත් විරුද්ධව නීතිමය පියවරක් ගැනීමට නොහැකි වන බව පවසන ලදි. එහිදි කණුව පිටිපස සිටින ගෙහිමියාගෙන් අදාල මුදල අය කර ගත නොහැකි බව පවසන ලදි. වීදි පහන දැල්වීමේ සහ අක්‍රිය කිරීමේ වගකීම ඇත්තේ ප්‍රාදේශිය සභාවට වන බැවින් එයට සහය දැක්වීමට පමණක් ගෙහිමියාව භාවිතා කරන බව පවසන ලදි. එම නිසා මෙම යෝජනාව ඉදිරියට ගෙන යාම ඵලක් නොවන බවත් එසේ කිරීම නීතිමය හා මානුෂිය අතින්ද නිවැරදි නොවන බව පවසන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, මෙම යෝජනාව සම්බන්ධයෙන් කමිටුවේදි සාකච්ඡා කිරීමෙන් පසු මහ සභාවට යොමු කල අතර මෙහිදි විදුලිය විසන්ධි කර ගාස්තු අය කිරීමේ අරමුණ ප්‍රජාව පෙළඹවීම වන බව පවසන ලදි. කිසියම් තැනක වීදි පහන විසන්ධි කිරීමෙන් පසු එය නැවත සක්‍රිය කිරීමට කිසිවෙකු හෝ පැමිණිය හැකි අතර එම පැමිණෙන සහ එම අවශ්‍යතාවය ඇති පුද්ගලයා ඉහත යෝජනාවේ අරමුණ වන බව පවසන ලදි. එනම් මෙම යෝජනාවේ මූලික පරමාර්ථය ජනතාව පෙළඹවීම වන අතර එමඟින් විදුලිය අවභාවිතය නතර කල හැකි බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එම්.සුරංග රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මහතා කතා කරමින්, බල ප්‍රදේශය තුල වීදි පහන් 17200ක් පමණ නඩත්තු කරන අතර කිලෝ වොට් 344ක් පමණ දවසක් තුල වැය වන අතර එක් පැයක් තුල කිලෝ වොට් 26ක් පමණ අවභාවිතයක් සිදු වන බව පවසන ලදි. මෙය විශාල ගැටලුවක් බව නොතේරුනද රටක් ලෙස ගත් කල මෙගාවොට් විශාල ප්‍රමාණයක විදුලිය නාස්තියක් සිදු වන බැවින් ජනතාව මෙම විදුලිය නාස්තිය අවම කිරීමට පෙළඹවිය යුතු බව ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව දිවා කාලයේ දැල්වී තිබෙන වීදි පහන් විසන්ධි කිරීමෙන් පසුව නැවත සක්‍රිය කිරීමේදි ගාස්තුවක් අය නොකරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

23) වීදි පහන් අලුත්වැඩියා කිරීම සඳහා ලැයිස්තුගත මන්ත්‍රිවරුන් 19 දෙනාට සහභාගි වීමට අවස්ථාව ලබා ගැනීමට අදාලව ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා ඉදිරිපත් කර ඇති යෝජනාව සම්බන්ධයෙන් කරුණු විමසන ලදි.

ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා කතා කරමින්, සියලුම මන්ත්‍රිවරුන්ට සම අයිතිවාසිකම් තිබිය යුතු අතර සියලුම ප්‍රතිලාභ සෑම මන්ත්‍රිවරයෙකුටම තිබිය යුතු බව පවසන ලදි. එහිදි තම කොට්ඨාසය තුල වීදි පහන් අලුත්වැඩියා කිරීමේදි විපක්ෂ මන්ත්‍රිවරුන් අපහසුතාවයට පත් වී ඇති හෙයින් එම ගැටලුවට නිසි පිළිතුරු ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි. පසුගිය කාල වකවානුවන් තුල බලයට පත් වී සිටි ගරු සභාපතිවරුන් එකට එක් වී වැඩ කටයුතු වි විශාල සේවයක් ජනතාවට සිදු කල අතර වර්තමානය වන විට එම තත්වය වෙනස් වී ජනතාවට අවශ්‍ය සේවය සලසා දීමට නොහැකි උද්ගත වී ඇති බව පවසන ලදි. මේ සඳහා විසඳුමක් අවශ්‍ය බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මහතා කතා කරමින්, ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා පැවසූ ආකාරයේ කිසිදු ගැටලුවක් තමාගේ කොට්ඨාසය තුල නොමැති බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මහතා කතා කරමින්, වීදි පහන් අලුත්වැඩියාව පිළිබඳ ප්‍රධාන කාර්යාලයට දැනුම් දුන්නද අලුත්වැඩියා කටයුතු සිදු වන්නේ දැනුම් දුන් ප්‍රමාණයෙන් ඉතා සුළු ප්‍රමාණයක් බව පවසන ලදි. එමෙන්ම මාර්ග අලුත්වැඩියා කිරීම සම්බන්ධවද විවිධ ගැටලු පවතින අතර විපක්ෂයක් එම මන්ත්‍රිවරුන්ටද සම බලතල තිබිය යුතු බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මහතා කතා කරමින්, පෙර මහ සභාවකදි කණු අංක කිරීමට සහ 10%ක වාර්ෂිකව සෝලා ක්‍රමයට ක්‍රියා කරන වීදි පහන් යෙදීමට යෝජනා කල අතර එය තවමත් ක්‍රියාත්මක වන්නේ ඇයිදැයි නොදන්නා බව පවසන ලදි. මන්ත්‍රිවරයෙකුගේ ප්‍රධාන කාර්යභාරය වනුයේ ජනතාවට නීතිය හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම වන අතර ජනතාවට සේවය කිරීමට මන්ත්‍රිවරුන් බැදී සිටින බව ප්‍රකාශ කරන ලදි. කණු අංක කිරීමේ ක්‍රියාවලිය පැවතියේ නම් ඕනෑම අයෙකුට සාධාරණ ලෙස සභාවෙන් වීදි පහන් අලුත්වැඩියා කටයුත්ත සිදු කර ගත හැකි බව

පවසන ලදි. එමෙන්ස තවමත් වීදි පහන් සම්බන්ධයෙන් විවිධ සොරකම් සිදු වන අතර කණු අංක කිරීමෙන් මෙම සොරකම් මැඩපැවැත්විය හැකි බව පවසන ලදි. ඒ අනුව කණු අංක කිරීමේ ක්‍රියාත්මක කරන ලෙස එතුමා නැවත යෝජනා කරන ලදි.

ගරු මන්ත්‍රී එම්.සුරංග රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මහතා කතා කරමින්, මේ පිළිබඳව දීර්ඝ වශයෙන් කාර්මික කමිටුවේදි සාකච්ඡා කල අතර වීදි පහන් කණු වල එදිනෙදා මරණ දැනවීම් අලවන බැවින් කණු අංක කිරීමට නොහැකි බව පවසන ලදි. එම නිසා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සුදුසු බව පවසන ලදි. ඒ අනුව වීදි පහන් අක්‍රිය වීමට ඇති තාක්ෂණික හේතු සලකා බලා කටයුතු සිදු කල යුතු අතර ඉදිරියේදි දේශගුණික සාධකයන්ට සහ පවතිනා තාක්ෂණික ගැටලු වලට ඔරොත්තු දෙන ආකාරයට වැඩපිළිවෙලක් සකස් කල යුතු බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මහතා කතා කරමින්, මන්ත්‍රිවරුන් විසින් ලබා දෙන වීදි පහන් අලුත්වැඩියාවන් කඩිනමින් සකස් සිදු කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි. එමඟින් මනිත්‍රිවරුන් සහ ජනතාව අපහසුතාවයට පත් වීම වලක්වාගත හැකි බව පවසන ලදි. විදුලිය අපතේ යැවීමෙන් විශාල මුදල් නාස්තියක් සිදු වන බැවින් එය වලක්වාගත යුතු අතර එලෙස නාස්ති වන්නේ තවත් දුගී ජනයාට ආධාර කල හැකි මුදල් බව පවසන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා විසින් ඉහත ආකාරයේ යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳ කණගාටුවන බව පවසන ලදි. මෙවැනි යෝජනාවක් සම්මත කල නොහැකි අතර එවැනි ක්‍රමයක් නොමැති බව පවසන ලදි. ඒ සඳහා ආදාල පරිපාලන නිලධාරින් සහ විදුලි අංශ නිලධාරින් හරහා එම අවශ්‍ය දැනුම් දීම් සිදු කිරීම සුදුසු බව පවසන ලදි. විදුලි අංශයේ කලින් පැවති අඩුපාඩු සාදා ගනිමින් ඉදිරියට යාමට විශාල උත්සාහයක යෙදෙන බව පවසන ලදි. විදුලි පහන් ඉක්මනින් අක්‍රිය වීම සාමාන්‍ය දෙයක් වුවත් ඒ සඳහාද නව ක්‍රමවේදයක් සකස් කිරීමට බලාපොරොත්තු වන අතර ඉදිරි වර්ෂයේදි ඒ සඳහා මුදල් වෙන් කර ගනිමින් කටයුතු සිදු කිරීමට මේ වන විටත් කමිටු හරහා සාකච්ඡා කර ඇති බවද පවසන ලදි. ඒ අනුව වීදි පහන් අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා කිසිදු මන්ත්‍රිවරයෙකු සහභාගි නොවිය යුතු අතර අදාල නිලධාරින් පමණක් සහභාගි විය යුතු බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

24) ලුණුවිල ජය මාවතේ සභාව සතු ඉඩමේ ඇති ප්‍රජා ශාලාවට අලුතින් විදුලිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

25) නො.104, ඉහළ දූම්මලකොටුව, දංකොටුව පදිංචි අකලංක මධුෂාන් ජයවර්ධන යන අයගේ දරුවාට රු.25,000.00ක වෛද්‍ය ආධාර මුදලක් ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

26) කොළින්ජාඩිය රන්දියගම ප්‍රදේශයේ වර්ෂා ජලය බැස්සවීම සඳහා පිඹුරු අංක 10359 හි කැබලි අංක 04 දරණ ඉඩමේ ඉදි කර ඇති ජල මෝටර් පද්ධතිය පවත්වාගෙන යාම සඳහා අදාල ඉඩමේ හිමිකරු සමඟ එකඟතා ගිවිසුමට එළඹීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මහතා විසින් ස්ථිර කරන ලදි. මේ පිළිබඳ ලේකම්තුමාගෙන් පැහැදිලි කිරීමකි අවශ්‍ය බැවින් මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක්

බවට පත් කිරීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන් පසු ලේකම්තුමා විසින් මේ පිළිබඳ පැහැදිලි කරන ලදි. නැවත කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන් පසු එම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

27) ජාතික ක්‍රීඩා උළලේදි ජාතික එල්ලේ ශූරතාවය හිමිකරගත් වයඹ පළාත් කණ්ඩායම නියෝජනය කල වෙන්නප්පුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ක්‍රීඩකයන් සඳහා ඇගයීම් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අදාල යෝජනාව ගරු ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

28) කිරිමැටියාන උප කාර්යාලයේ ගාල් කර තිබෙන වාහන සඳහා බෝතලේගම ඉන්ධන පිරවුම්හලෙන් ඉන්ධන ලබා ගැනීම සඳහා රු.283,000.00ක මුදලක් ඇප තැන්පතු වශයෙන් තැබීමට අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

## 4. කාරක සභා වාර්තා සලකා බැලීම.

a) 2025.08.20 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව

- ❖ 2025.08.20 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්ථාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

b) 2025.08.19 දින පැවති කාර්මික සේවා කාරක සභාව

- ❖ ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා විමසා සිටියේ ඇස්තමේන්තු පිලියෙල කිරීමේදි කලබලකාරි තත්වයක් තිබූ අතර එයට හේතුව විමසා සිටින ලදි.

ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා කතා කරමින්, වැඩ අවසන් කිරීමට හදිසියක් නොතිබුනු අතර නව ආණ්ඩුව බලයට පත් වන විට ඇස්තමේන්තු සකස් කර ටෙන්ඩර් කැඳවා තිබූ අතර දේවස්ථාන කිහිපයක වාර්ෂික මංගල්‍ය පැවැත්වූ බැවින් එම මාර්ග පිළිසකර කර දීමට සිදු වූ බව පවසන ලදි. එලෙසම විශාල වශයෙන් අබලන් වී තිබ මාර්ග සම්බන්ධයෙන් වරින් වර ඇස්තමේන්තු කිරීමට පෙර අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට සිදු වූ බව පවසන ලදි. ඒ සියලු දෙයක්ම ජනතාවගේ අවශ්‍යතාවය මත සිදු වූවක් වන බැවින් කලබලකාරිව සිදු වූවක් නොවන බව පැහැදිලි කරන ලදි.

c) 2025.08.21 දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව

- ❖ 2025.08.21 දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභා වාර්ථාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

d) 2025.08.22 දින පැවති ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව

❖ 2025.08.22 දින පැවති ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභා වාර්ථාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

e) 2025.08.28 දින පැවති පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව

❖ ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය කතා කරමින්, සිරිගම්පල පානීය ජලය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ විමසන ලදි. එම ටැංකි තුල ජලය සිදී යමින් පවතින අතර නළලිං තුල පණුවන් බෝ වී ඇති බවද පවසන ලදි. විවිධ යෝජනාවන් කමිටු හරහා ඉදිරිපත් කලද මේ සම්බන්ධයෙන් ගෙන ඇති වර්තමාන විසඳුම පිළිබඳ තොරතුරු විමසන ලදි.

පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාවේ කමිටු සභාපති වන ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මහතා පවසා සිටියේ ජල බවුසරයේ ගමන් කරන නිලධාරි මහතා කල සාකච්ඡාවෙදි ඉණිමඟක අඩුපාඩුවක් ඇති බව පැවසූ පසු ඉණිමඟක් ලබාදීමට අවශ්‍ය කටයුතු සලසා දුන් පසු නැවත විවිධ හේතුන් ඉදිරිපත් කල බවයි.

ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය කතා කරමින්, වරින් වර විවිධ යෝජනාවන් ඉදිරිපත් කලද මේ වන විටක් කිසිදු යෝජනාවක් ක්‍රියාත්මක වී නොමැති බව පවසන ලදි. විශාල මුදල් ප්‍රමාණයක් වැය කරමින් ටැංකි සකස් කල අතර මේ වන විට ජනතාවට නැති වී ඇත්තේ මිනිසාගේ මූලික අවශ්‍යතිවයක් වන පානීය ජලය වන බැවින් මේ පිළිදව සොයා බලා යම් කිසි ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි. ඒ අනුව මේ පිළිබඳ ලේකම්තුමාගෙන් කරුණු පැහැදිලි කිරීමක් අවශ්‍ය බැවින් මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන් පසු ලේකම්තුමා විසින් මේ පිළිබඳව පැහැදිලි කරන ලදි. නැවත කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය විසින් ස්ථිර කරන ලදි.

f) 2025.08.04, 2025.08.12, 2025.08.26 සහ 2025.08.28 දින පැවති ටෙන්ඩර් කමිටුව

❖ 2025.08.04, 2025.08.12, 2025.08.26 සහ 2025.08.28 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්ථා සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

**5. ආදායම්/වියදම් වාර්තා හා වෙනත් වාර්තා සලකා බැලීම**

a) 2025 ජූලි මස ආදායම් වාර්තාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

b) 2025 ජූලි මස වියදම් වාර්තාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

c) ජූලි මස විදුලි පහන් නඩත්තුවට අදාල ප්‍රගති වාර්තාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

d) ජූලි මස වාහන ධාවනයට අදාල වාර්තාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

**6. වෙනත් කරුණු**

1) බෝලවත්ත හන්දියේ සිට ජපන් පාලම දක්වා කාණුවක් ඉදි නොකිරීම නිසා උදගත වී ඇති ගැටලුව පිළිබඳව සාකච්ඡා කිරීම - ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මයා

බෝලවත්ත හන්දියේ සිට ජපන් පාලම දක්වා තිබෙන ඇළට බෝලවත්ත හන්දියේ තිබෙන ජලය ගලා යාමට කණුවක් පවතින අතර පාර දෙපස ඇති එම කාණු පද්ධතියේ එක කොටසක් පමණක් ඉදි කර ඇති අතර අනෙක් කොටස මීටර් 100ක් පමණ ඉදි කර නොමැති අතර එය ගැටලුවක් වී ඇත. එම මීටර් 100ක ප්‍රමාණය පරවූවා නම් ජලය ඇළට රැගෙන යා හැකි බව පවසන ලදි. මෙම හේතුව නිසා බෝලවත්ත හන්දියේ සහ අවට ඉඩම් වලින් එන ජලය පහළ කම්මල දෙසට ගලා යන අතර එමඟින් වර්ෂා කාලවලදි ගංවතුර තත්වයක් ඇති වීමේ අවධානමක් ඇති බව පවසන ලදි.

ඒ අනුව මේ පිළිබඳව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

2) පළාත් පාලන සතිය වැඩසටහන ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම - ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සංදීප් මයා.
ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සංදීප් මහතා කතා කරමින්, පළාත් පාලන සතිය රට පුරාම ක්‍රියාත්මක වන වැඩසටහනක් වන අතර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව තුලත් පළාත් පාලන සතිය ක්‍රියාත්මක කරීම සඳහා අවශ්‍ය උපදෙස් පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී ඇති බව පවසන ලදි. ඒ අනුව සැප්තැම්බර් 15 සිට 21 දක්වා පළාත් පාලන සතිය ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලැබී ඇති බව පවසන ලදි.

ඒ අනුව එම දිනයන් වෙන් වී ඇති ආකාරය පහත පරිදි වේ.

| දිනය | | ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන/ වැඩසටහන් |
|---|---|---|
| 2025.09.15 | ජංගම සේවා දිනය | |
| | | ප්‍රාදේශීය සභාවේ සේවාවන් පිළිබඳ දැනුවත් කිරීමේ අත් පත්‍රිකා බෙදීම. |
| | | මහජන පැමිණිලි හා ඉල්ලීම් භාර ගැනීම ආරම්භ කිරීම. |
| | | ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු අය කිරීම. |
| | | සෞඛ්‍ය සායනය සහ අක්ෂි සායන පැවැත්වීම. |
| | | රැකියා විරහිත තරුණ තරුණියන් වෙත රැකියා අවස්ථා හඳුන්වා දීම. |
| | | වෘත්තීය පුහුණු පාඨමාලා පිළිබඳ දැනුවත් කිරීම |
| | | කොම්පෝස්ට් පොහොර අලෙවි කිරීම. |
| | | නොදිරන කසල භාර ගැනීම. |
| 2025.09.16 | පරිසර සහ රුක් රෝපණ දිනය | |

| | | |
|---|---|---|
| | | පළතුරු පැල සිටුවීම |
| | | කසළ කළමනාකරණය පිලිබඳව වීථි නාට්‍ය මඟින් දැනුවත් කිරීම. |
| 2025.09.17 | සෞඛ්‍ය හා සනීපාරක්ෂක දිනය | |
| | | දංකොටුව ආයුර්වේද බෙහෙත් ශාලාවේ පංච කර්ම සායනය ආරම්භ කිරීම. |
| | | ඩෙංගු මදුරුවන් බෝවිය හැකි ස්ථාන පරීක්ෂාව / අත්පත්‍රිකා බෙදා දීම. |
| | | දංකොටුව කාණු පද්ධතිය පිරිසිදු කිරීම. |
| | | ආහාර සැපයුම් ආයතන පරීක්ෂා කිරීම. |
| | | වාහන ගමනාගමනයට බාධාකාරී ගස් අතු කපා දැමීම. |
| | | පවිත්‍ර කිරීමේ වැඩසටහන් |
| 2025.09.18 | ආදායම් ප්‍රවර්ධන දිනය | |
| | | "අපි පළාත් පාලන ආයතන වෙත බදු ගෙවන්නේ ඇයි" යන්න ප්‍රජාව දැනුවත් කිරීමේ ප්‍රචාරක වැඩසටහන |
| | | තෝරාගත් කලාපය තුලට කණ්ඩායම් වශයෙන් ගොස් මාර්ගගත ක්‍රමයට වරිපනම් බදු ගෙවීම පිලිබඳ ජනතාව දැනුවත් කිරීමේ අත්පත්‍රිකා බෙදා දීම. |
| | | හිඟ ආදායම් රැස්කිරීම. |
| | | වරිපනම් ඒකක සඳහා නම් ඇතුලත් කිරීම. |
| | | ව්‍යාපාර බදු අය කිරීම. |
| | | වෙළඳබලපත්‍ර අයදුම්පත්‍ර භාර ගැනීම. |
| 2025.09.19 | අධ්‍යාපන සහ පුස්තකාල ප්‍රවර්ධන දිනය | පුස්තකාල 11 හි පාඨක සමාජ සඳහා සාහිත්‍ය තරඟ පැවැත්වීම හා ත්‍යාග ප්‍රදානය |
| | | ගී රස වින්දන වැඩසටහන |
| 2025.09.20 | මහජන උපයෝගිතා දිනය | |
| | | දංකොටුව සතිපොල පවිත්‍ර කිරීම |
| | | හාල්දඩුවන මල්වත්ත පාර තාර මාර්ගයක් සෑදීම |
| | | හාල්දඩුවන හා කහටවිල සුසාන භූමි පවිත්‍ර කිරීමේ ශ්‍රමදානය |
| 2025.09.21 | ක්‍රීඩා දිනය සහ සහතිකපත් දිනය | වෙරළ උද්‍යානය පවිත්‍ර කිරීමේ වැඩසටහන |
| | | වොලිබෝල් තරඟය/ වෙනත් ජන ක්‍රීඩා |
| | | සහතික හා ත්‍යාග ප්‍රදානය |

3) බල ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීම සඳහා සකස් කර ඇති අත් පත්‍රිකාව ප්‍රසිද්ධ කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම - ගරු සභාපති ටී.බී.ඩී ඇන්ටනී කුමාර් මයා.

ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා කතා කරමින්, කැළැ වී ඇති පෞද්ගලික ඉඩම් සුද්ද පවිත්‍ර කිරීමට අදාලව දැන්වීම් පුවරුවක් ස්ථාපිත කරන ලෙස කාර්මික කමිටුවේදී සාකච්ඡා කල අතර ඒ පිළිබඳ විස්තරයද අත් පත්‍රිකාවේ සඳහන් වී ඇති නමුත් එය තවමත් ක්‍රියාත්මක වී නොමැති බව පවසන ලදි. වර්තමානය වන විට නැවත ඩෙංගු රෝගය සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින බැවින් මේ පිළිබඳව පෙලඹවීම සඳහා පුවරු ස්ථාපිත කිරීම සුදුසු බව පවසන ලදි. ඒ අනුව එම කාරණාවන් වැඩිදුරටත් තහවුරු කර ගනිමින් ඉදිරි කටයුතු සූදිනම් කර ගන්නා බව පවසන ලදි.

ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය පවසා සිටියේ ජයකොඩි ක්‍රීඩාංගනයේ ඇති ඉඩමට ආරක්ෂිත වැටක් සකසා දීම සුදුසු බව පවසන ලදි. එමෙන්ම කසල ආදිය එම ඉඩමට දමා යන බැවින් එය ප්‍රාදේශය සභාව සතු ඉඩමක් බව දැනුවත් කිරීමට පුවරුවක් ස්ථාපිත කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මහතා පවසා සිටියේ නොදිරන අපද්‍රව්‍ය එනම් පොලිතින් හා ප්ලාසිටික් ආදිය පිළිස්සීමෙන් පිටවන දූමාරයෙන් පිළිකා රෝග වැලදිය හැකි බවද දැනුවත් කිරීමක් ලෙස අත් පත්‍රිකාවට ඇතුලත් කිරීම සුදුසු බවයි.

ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය කතා කරමින්, සභාව සතු පාලම්කණුව සුසාන භූමියක් වන අතර එහි ආරක්ෂිත වැටක් නොමැති බවද පවසන ලදි. එහි භූමදාන කටයුතු සිදු කිරීමට ප්‍රාදේශිය සභාවෙන් අවසර ගත යුතු වූවත් අනවසරයෙන් දැනුම්දීමකින් තොරව භූමදාන කටුයුතු සිදු වන බව පවසන ලදි. එම නිසා එවැනි කටයුතු සිදු නොකිරීමට ආරක්ෂිත වැටක් සකසා දෙන ලෙස පවසන ලදි. එමෙන්ම සිරිගම්පල කුඩා ඉඩම් කොටසක් ඇති බැවින් එහි ක්‍රිස්තියානි ආගමිකයන් භූමදාන කටුතු සිදු කර වළ බැදීම් කරන අතර මෙය අවට ජනතාවට විශාල ගැටලුවක් වී ඇති බැවින් මේ පිළිබඳ සොයා බලා කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදි.

4) ලෝක නගර දිනයට සමගාමීව ක්‍රියාත්මක කිරීමට යෝජිත සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා කිරීම - ගරු මන්ත්‍රී එම්.සුරංග රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා

ගරු මන්ත්‍රී එම්.සුරංග රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මහතා කතා කරමින්, ලෝක නගර දිනයට සමගාමීව වෙන්නප්පුව ප්‍රදේශය සභාව සංචාරක කර්මාන්තයේ ගමනාන්තය ලෙස නම් කර ඇති බව පවසන ලදි. එමගින් ආර්ථිකමය වශයෙන් සභාවට සහ ප්‍රදේශයට විදේශ විනිමය ලබා ගැනීමට අවස්ථාව උදා වන අතර එමඟින් බලාපොරොත්තු වන්නේ සංචාරකයින්ට අවශ්‍ය සියලු පහසුකම් ලබා දීම බවද පවසන ලදි. එපමණක් නොව නගර කර්මාන්තකරුවන්ගේ සංගමය සමඟ එකතු වී ක්ෂේත්‍ර චාරිකාවක්ද සංවිධානය කල අතර ඊට සමගාමීව නයිනමඩම වෙරළ උද්‍යානය සංවර්ධනය කිරීමට මුදල් ප්‍රතිපාදනද වෙන් කර ගෙන ඇති බවද පවසන ලදි. මෙම සියලුම ක්‍රියාදාමයන් මඟින් සභාවට මුදල් උත්පාදනය කර ගැනීමට හැකි වන බව පවසන ලදි. මෙහිදි සභාවට ලබා ගත හැකි ආදායම් මාර්ග හා ජනතාවට ලැබීමට තිබෙන ආදායම් තත්වයද ඉහළ නැංවිය හැකි අතර ගිං ඔය සහ හැමිල්ටන් ඇළ අතර කොටස දියුණු කර සංචාරකයින්ට මීගමුව සිට වෙන්නප්පුව දක්වා ගමනාගමනය කිරීමට අවශය පහසුකම් සලසා දීමටද කටයුතු සූදානම් කිරීමට සාකච්ඡා සිදු කරමින් පවතින අතර මෙමඟින් ජාත්‍යන්තරයට පවා යාමට හැකියාව පවතින බව පවසන ලදි. ඒ සඳහා සියලු දෙනාගේම සහයෝගය ඉල්ලා සිටින ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, ලෝක නගර දිනයට සමගාමීව නගර නිර්මාණකරුවන්ගේ සංගමය විසින් මීළඟ වසරේ අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීමට වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව තෝරා ගෙන ඇති අතර මෙයට සමගාමීව ගිං ඔය සහ හැමිල්ටන් ඇළ නවීනකරණය කර සංචාරකයින්ට ගමනාගමන පහසුකම් ලබා දී සංචාරක කර්මාන්තය නගා සිටුවීමට රජයෙන්ද ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කරන බව පවසන ලදි.

ඉන් පසු සියලු දෙනාටම ස්තුතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 2.00ට පමණ මහ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.

ටී.බී.ඩී ඇන්ටනි කුමාර්
සභාපති,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.